සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 6 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

**සැලකිය යුතුයි:**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුරට ලකුණු 2 බැගින් ලකුණු 40කි. වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) මහමායා දේවියගේ මව්පියන් ජීවත් වූයේ,
(1) රජගහනුවර ය. (2) දෙව්දහ නුවර ය.
(3) විශාලා මහනුවර ය. (4) කිඹුල්වත් නුවර ය.

(02) ඇසළ පොහොය දින සිදු වූ වැදගත් සිදුවීමක් වන්නේ,
(1) සිදුහත් කුමරුගේ උත්පත්තිය යි.
(2) සිදුහත් බෝසතාණන්ගේ මහාභිනිෂ්ක්‍රමණයයි.
(3) බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමයි.
(4) සිදුහත් බෝසතාණන් බුද්ධත්වයට පත්වීමයි.

(03) තම රාජ්‍යය දෙකට බෙදා පාලනය කරන්නට සිදුහත් බෝසතාණන් වහන්සේට ආරාධනා කළේ,
(1) බරණැස් රජු ය. (2) බ්‍රහ්මදත්ත රජු ය.
(3) කොසොල් රජු ය. (4) බිම්බිසාර රජු ය.

(04) පංච ශීලයෙහි සිව්වෙනි ශික්ෂා පදයෙන් අදහස් වන්නේ,
(1) මුසාවාදයෙන් වැළකීම ය. (2) සුරාපානයෙන් වැළකීම ය.
(3) ප්‍රාණඝාතයෙන් වැළකීම ය. (4) වැරදි කාම සේවනයෙන් වැළකීම ය.

(05) ''මෙමල මිලිනව යයිද යම්සේ - මගේ සිරුරත් එලෙස වැනසේ'' මෙම කවි පදවලින් කියැවෙන්නේ,
(1) අනිත්‍යතාවයි. (2) දුක් බවයි.
(3) මරණයයි. (4) අනාත්ම බවයි.

(06) තමා ගැන සිතා අන් අයට අවැඩ පිණිස හේතුවන ක්‍රියාවන්ගෙන් වැළැකී, වැඩ පිණිස හේතුවන ක්‍රියාවන්හි නිරත වීම,
(1) අනාත්ම දහම වේ. (2) අත්තූපනායික දහම වේ.
(3) අහේතුක දහම වේ. (4) හේතුඵල දහම වේ.

Department of Education – Western Province

(07) දැඩි ලෝභය නිසා දුකට පත්වන බව පෙන්වා දෙන ජාතක කථාව වන්නේ,

(1) සුතසෝම ජාතකයයි. (2) සාම ජාතකයයි.
(3) වෙස්සන්තර ජාතකයයි. (4) ස්වර්ණ හංස ජාතකයයි.

(08) බුදුදහමට අනුව තෙරුවන් ගැණ පැහැදීම,

(1) ශීලයයි. (2) භාවනාවයි. (3) ත්‍යාගයයි. (4) ශ්‍රද්ධාවයි.

(09) ශ්‍රද්ධාවන්තයෙකු තුළ **නොමැති** ලක්ෂණයක් වන්නේ,

(1) සිල්වතුන් දැකීමයි.
(2) දහම් ඇසීමයි.
(3) පිළිම අලෙවි කිරීමයි.
(4) මසුරුමල දුරුකොට පරිත්‍යාග කිරීමයි.

(10) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(1) නිල්මානෙල් මල ය. (2) රෝසමල ය.
(3) නෙළුම් මල ය. (4) සුදු අරලිය මල ය.

(11) සම්මා වාචා වලට අයත් **නොවන්නේ,**

(1) බොරු කීමෙන් වැළකීමයි. (2) කේලම් කීමෙන් වැළකීමයි.
(3) හිස්වචන කීමෙන් වැළකීමයි. (4) ගීත ගැයීමෙන් වැළකීමයි.

(12) බුදුන්වහන්සේ කිඹුල්වත් පුරයට වැඩියේ,

(1) වෙසක් පොහොය දිනක දී ය. (2) පොසොන් පොහොය දිනක දී ය.
(3) ඇසළ පොහොය දිනක දී ය. (4) නිකිණි පොහොය දිනක දී ය.

(13) මෙත් වැඩීමේ අනුසස්,

(1) 12 කි (2) 11 කි (3) 16 කි (4) 15 කි

(14) සිදුහත් කුමරුට අනෝමා ගංතෙරේදී සිවුරු පිරිකර පූජා කළේ,

(1) සක් දෙවිඳුන් විසිනි. (2) ඝටීකාර මහා බ්‍රහ්මයා විසිනි.
(3) සහම්පති මහා බ්‍රහ්මයා විසිනි. (4) සතරවරම් දෙවිවරුන් විසිනි.

(15) ''යස්සමූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා'' යන ගාථාවෙන් කියවෙන්නේ,

(1) බෝධි වන්දනාවයි. (2) චෛත්‍ය වන්දනාවයි.
(3) පිළිම වන්දනාවයි. (4) ධාතු වන්දනාවයි.

(16) ''වුද්ධානුමතං'' යනු,

(1) දෙමාපියන්ගේ උපදෙස් ගැනීම ය.
(2) ගුරුවරුන්ගේ උපදෙස් ගැනීම ය.
(3) මහා සංඝරත්නයේ උපදෙස් ගැනීම ය.
(4) වැඩිහිටියන්ගේ උපදෙස් ගැනීම ය.

Department of Education – Western Province

(17) සියලු ජාතීන් අතර එකමුතු බවද, එකිනෙකා අතර අවබෝධයද ජාතික කොඩියේ නිරූපණය වන්නේ,

(1) තද රතු පාට මගිනි. (2) කහ තීරුව මගිනි.

(3) අසිපත මගිනි. (4) බෝපත් සතර මගිනි.

(18) කිසියම් ක්‍රියාවක් හොඳ ද නරක ද දැයි මැන බලන මිනුම් දඬු ඇතුළත් කොට දේශනා කළ බෞද්ධ සූත්‍රය වන්නේ,

(1) සිඟාලෝවාද සූත්‍රයයි. (2) මංගල සූත්‍රයයි.

(3) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

(19) දිවා රාත්‍රී පින්වැඩෙන කරුණක් වන්නේ,

(1) පැන්හල් පොකුණු කරවීම ය. (2) වෘක්ෂයන්ට වන්දනා කිරීම ය.

(3) අසරණයන්ට පිහිට වීම ය. (4) දුප්පතුන්ට නිවාස ඉඳිකර දීම ය.

(20) සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගත්තේ,

(1) වෙසක් පොහොය දිනකදී ය (2) ඇසළ පොහොය දිනකදී ය

(3) පොසොන් පොහොය දිනකදී ය (4) උඳුවප් පොහොය දිනක්දී ය

(ලකුණු 2 x 20 = 40)

Department of Education – Western Province

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්න වලට ලකුණු 10 බැගිනි.**

(01) එදිනෙදා ජීවිතයේ දී නොයෙක් අභියෝගවලට මුහුණ දීමට ඔබට සිදුවිය හැකිය. සිදුහත් බෝසතාණන් ගේ චරිතයේ අභියෝග අදාල කරගෙන, ඔබ පන්ති කාමරයේ සිදුකළ ඇගයීම ද සිහියට නගාගෙන, පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) සිදුහත් කුමරු උගත් ශිල්ප ශාස්ත්‍ර දෙකක් නම් කරන්න.

(2) පංචමහා විලෝකනයෙන් දෙකක් ලියන්න.

(3) සිදුහත් කුමාරෝත්පත්තියේ සිදු වූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න.

(4) සිදුහත් බෝසතාණන් ආසන්න පෙර භවයේ සිටියේ කිනම් දෙව් ලොවෙහි ද?

(5) වෙසක් පෝය බෞද්ධ අපට වැදගත්වීමට හේතු දෙකක් ලියන්න.

(6) සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.

(7) බුදුවීමේ දී බෝසතාණන් මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.

(8) ශිෂ්‍යයකු වශයෙන් පාසලේ දී ඔබ ලැබූ අභියෝග දෙකක් සඳහන් කරන්න.

(9) ඔබ පංති කාමරයේ සිදුකළ ඇගයීම ඇසුරින් ඔබ ලද අත්දැකීම් දෙකක් ලියන්න.

(10) අභියෝග ජය ගැනීම සඳහා ඔබ තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

(මුළු ලකුණු 2x10 = 20)

(02) (1) පංච ශීලයෙහි පළමු හා පස්වෙනි ශික්ෂා පද මොනවා ද? (ලකුණු 02)

(2) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය ලියා දක්වන්න. (ලකුණු 03)

(3) සුරාපානයෙන් සිදුවන අයහපත් ප්‍රතිඵල පහක් ලියන්න. (ලකුණු 05)

(03) ''දෙපෝදාට පුන්සඳ වාසනාවන් - ජාතිත් අපේ මව්පියෝ වාසනාවන්''

(1) මෙම කවියේ දෙවෙනි පදයෙන් කියවෙන්නේ කවරෙකුගේ ගුණ වරුණ ද? (ලකුණු 02)

(2) දරුවන්ගෙන් මව්පියන්ට ඉටුකළ යුතු යුතුකම් අඩංගු බෞද්ධ සූත්‍රයේ නම කුමක් ද? (ලකුණු 03)

(3) දෙමව්පියන් සතුටින් තැබීමට අප කළයුතු කාර්යය පහක් ලියන්න. (ලකුණු 05)

(04) (1) මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කළේ කුමන රජතුමාගේ කාලයේ ද? (ලකුණු 02)

(2) සමනාමයං මහාරාජ..... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(3) මිහිඳු මහ රහතන්වහන්සේ ලක්දිවට වැඩම වීම නිසා ශ්‍රී ලාංකික අපට උරුම වූ දායාද පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

:(05) (1) බුදුරජාණන්වහන්සේ රාහුල කුමාරයාට ලබාදුන් දායාදය කවරේ ද? (ලකුණු 02)

(2) රාහුල හිමිගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ තුනක් ලියන්න. (ලකුණු 03)

(3) එම ගුණාංග අපේ ජීවිතය යහපත් කර ගැනීමට වැදගත් වන අයුරු වාක්‍ය පහකින් ලියන්න. (ලකුණු 05)

(06) (1) මඝ මානවක ඇතුළු පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්ති දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) සත් පුරුෂයෙකු සතු ලක්ෂණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(3) ශිෂ්‍යයන් වශයෙන් එකමුතුව වැඩ කිරීමේ අගය වාක්‍ය පහකින් දක්වන්න. (ලකුණු 05)

(07) (1) සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ උපදෙස් අඩංගු බෞද්ධ සූත්‍රයේ නම කුමක් ද? (ලකුණු 02)

(2) සම්පත් ආරක්ෂා කරන උපදෙස් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) තම නිවසේත්, පොදු ස්ථානවලත් සම්පත් ආරක්ෂා කර ගැනීමේ වටිනාකම පැහැදිලි කරන්න. (ලකුණු 05)

Department of Education – Western Province